# 6 උතුම් ම දේව මැවිල්ල



6.1 රූපය - රොබෝ යන්ත්‍රය

"මගේ උපත සිදු වුණේ, මීට අවුරුදු ගණනකට පෙර, විද්‍යාගාරයක ය. උපත කිව්වට, මම මව්කුසින් මෙලොව එළිය දුටුවේ නෑ. මට දෙමව්පියන්, සහෝදර සහෝදරියන් නෑ. මාව නිර්මාණය කළේ දක්ෂ ඉංජිනේරුවන් පිරිසක්. මනුෂ්‍යයා මාව විවිධ කාර්යයන් සඳහා යොදා ගන්නවා. වෛද්‍ය විද්‍යාවේ හා ජීව විද්‍යාවේ වගකීම් දැරීම, බෝම්බ නිෂ්ක්‍රීය කිරීම, සඳට යෑම, මිනිසාට ළඟා විය නොහැකි සියුම් තැන්වලට ගොස් තොරතුරු රැස් කිරීම ආදිය ඒවායින් කිහිපයක්. එහෙත් ඒ කාර්යයන් කිසිවක් මගේ තීරණ මත කරන දේවල් නොවෙයි. මනුෂ්‍යයා මා තුළට ඇතුළු කරන දත්ත නිසා තමයි මා ක්‍රියාත්මක වන්නේ මා ඒ දේවලින් මොන තරම් අරුම පුදුම කාර්යයන් කළත් මාව කොහෙත්ම මනුෂ්‍යයාට සමාන කරන්න බෑ. මට මනසක් නෑ. බුද්ධියක් නෑ. හදවතක් නෑ. ඒ වගේ ම මගේ නිදහස් කැමැත්තෙන් මට කිසි ම දෙයක් කරන්න බෑ. ඒත් මනුෂ්‍යයා ඒ වගේ නෙමෙයි. මනුෂ්‍යයා කියන්නේ දේව මැවිල්ලක්, ඉතා ම උතුම් කෙනෙක්. ඒ උතුම්කම එක්ක බලන කොට මම අංශුමාත්‍රයක්වත් වටින්නේ නෑ. මනුෂ්‍යයා කියන්නේ ජීවමාන කෙනෙක්. ඒ ජීවමාන බව ඔහුට ලැබුණේ දෙවියන් වහන්සේගේ ජීවන හුස්ම තුළිනි. ඒත් මම අනිත් අය විසින් ක්‍රියාත්මක කරවනු ලබන යන්ත්‍රයක්. මෙතෙක් ඔබට කතා කළ මම, රොබෝ යන්ත්‍රයක් වෙමි."

# මිනිසා අන් මැවිලිවලට වඩා උසස් වීමට හේතු

## 1. දේව ස්වරූපය හා සමානකම

ඉන්පසු දෙවියන් වහන්සේ; "අපගේ **ස්වරූපය** අනුව අපගේ **සමානත්වය** ලෙස මනුෂ්‍යයා මවමු ......."යි අණ කළ සේක. දෙවියන් වහන්සේ තම **ස්වරූපය** අනුව මිනිසා මැවූ සේක; දෙවියන් වහන්සේගේ ම **ස්වරූපය** අනුව ඔවුන් මවා වදාළ සේක. (උත්පත්ති 1:26)

දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ, තමන් වහන්සේගේ ම ස්වරූපය හා සමානකමට ය. දේව ජීවිතයට පංගුකාර වන්නේ, මිනිසා පමණි. දෙවියන් වහන්සේ දේව මැවිල්ල භාර දෙමින්, එය පාලනය කිරීමට, මෙහෙය වීමට සංරක්ෂණය කිරීමට හා වර්ධනය කිරීමට මිනිසාට පැවරූ සේක. දෙවියන් වහන්සේගේ මැවීමේ කාර්යයෙහි පංගුකාරයන් කර ගනු ලැබුවේ මිනිසා පමණි. මෙම කරුණුවලින් පෙනී යන්නේ, මිනිසා අන් මැවිලි සියල්ලට වඩා උතුම් බව ය.

## 2. මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට ජීවන හුස්ම හෙළීම

දෙවි සමිඳාණන් වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට **ජීවන හුස්ම** හෙළූ සේක.

(උත්පත්ති 2:7)

දූවිල්ලෙන් සැදූ මිනිසා, ජීවමාන පුද්ගලයකු වන්නේ, දෙවියන් වහන්සේ ජීවන හුස්ම හෙළූ නිසා ය. දෙවියන් වහන්සේ ජීවන හුස්ම හෙළුවේ මිනිසාට පමණි. සතුන් මැවීමේ දී එසේ කළේ නැත. එම නිසා මිනිසා අන් මැවිලි සියල්ලට වඩා උසස් වේ.

### 3. මිනිසා මැවූ දිනය "ඉතා" මනහර බව ප්‍රකාශ කිරීම

> දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියලු දේ නරඹා, එය **ඉතා** මනහර බව දුටු සේක.
>
> (උත්පත්ති 1:31)

අන් සියලු මැවිලි මැවූ පසු "එය මනහර" යයි පවසන දෙවියන් වහන්සේ මනුෂ්‍යයා මැවීමෙන් පසු පවසන්නේ "එය ඉතා මනහර" බව ය. මිනිසා මැවීමත් සමග දේව මැවිල්ල සම්පූර්ණ විය. අන් සියලු දේව මැවිලි දෙවියන් වහන්සේ ඇති කළේ මිනිසාගේ ප්‍රයෝජනය සඳහා ය.

### 4. මිනිසා සතුන් ව නම් කිරීම

> මිනිසා සියලු ගවමහිෂයන්ට ද අහසේ පක්ෂීන්ට ද සියලු මෘගයන්ට ද **නම් තැබී** ය.
>
> (උත්පත්ති 2:20)

මැවිල්ලේ සෑම සතෙකුට ම නම් තබනුයේ මිනිසා ය. එමගින් මිනිසාගේ සුවිශේෂත්වය හා උත්තරීතර බව පෙන්නුම් කරයි. මිනිසාට සියලු සත්වයන් කෙරෙහි බලය ඇති බවත් අන් මැවිලිවලට වඩා උතුම් බවත් ඒ අනුව පැහැදිලි ය.

## පුද්ගල විවිධත්වය හා එකිනෙකාට ගරු කිරීම

මැවිලි අතරින් උතුම් ම මැවිල්ල මිනිසා ය. අප සියලු දෙනා සමාන නොවෙති. අප සතු හැකියාවන්, රුචි අරුචිකම්, දක්ෂතා, ශරීරයෙහි හැඩය හා පැහැය වෙනස් විය හැකි ය. අපගේ බුද්ධි මට්ටම් ද විවිධ ය. එමෙන් ම ස්ත්‍රී පුරුෂ වශයෙන් ද අප වෙනස් ය. අප රටේ සිංහල, දෙමළ, මුස්ලිම් හා බර්ගර් යනුවෙන් ප්‍රධාන ජාතීහු හතරක් සිටිති. ඔවුහු බෞද්ධ, හින්දු ඉස්ලාම් හා කතෝලික/ක්‍රිස්තියානි යන ප්‍රධාන ආගම් හතර අදහති.

එපමණක් නොව අප එකිනෙකාගේ හැකියා විවිධ ය. එම හැකියාවල විවිධත්වය පහත පින්තුරවලින් ද පෙන්නුම් කරයි.




6.2 රූපය - විවිධ පුද්ගල හැකියා

මෙලෙස මිනිස් සංහතිය තුළ විවිධත්වයක් පවතින්නේ දේව සැලැස්ම අනුව වන අතර එමගින් මැවිල්ලේ අගය වැඩි වේ. ඒ නිසාම අපට අන් අයගේ සහයෝගය අවශ්‍ය වේ. තව ද අපි සියලු දෙනා ම දේව ස්වරූපය හා සමානකම ඇති දේව මැවිලි වෙමු. එම නිසා අපි සියලු දෙනා ම එකිනෙකාට ගරු කළ යුත්තෙමු. ස්ත්‍රී පුරුෂ විවිධත්වය තුළ පවා එකිනෙකාට ගරු කළ යුතු වෙමු. අප විවිධ ජාතිවලට අයත් වූවත් විවිධ ආගම්වලට අයත් වූවත් විවිධ භාෂා කථා කළත් පුද්ගල විවිධත්වයට ගරු කරමින් අපි එකිනෙකා සමග සාමයෙන් හා සහයෝගයෙන් ජීවත් විය යුතු වෙමු.

## ක්‍රියාකාරකම

(1) හිස්තැන් පුරවන්න.

(ඉතා මනහර, ජීවන හුස්ම, තම ස්වරූපය, ගවමහීෂයන්ට දුවිල්ලෙන්)

i දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියලු දේ නරඹා එය ................... බව දුටු සේක.

ii මිනිසා සියලු ................... ද අහසේ පක්ෂීන්ට ද සියලු මෘගයන්ට ද නම් තැබීය.

iii දෙවියන් වහන්සේ පොළොවේ ................... මනුෂ්‍යයා මවා වදාළ සේක.

iv දෙවියන් වහන්සේ ................... අනුව මිනිසා මැවූ සේක.

v දෙවියන් වහන්සේ මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට .................. හෙළු සේක.

(2) අන් මැවිලිවලට වඩා මිනිසා උසස් වීමට හේතු **තුනක්** ලියන්න.

(3) කිතුනු ගී පොතේ 480 ගීතිකාව (කවුරු වුවත් ඔබ) කියවා, එම ගීතිකාවෙන් ඔබට ලැබෙන පණිවිඩ **තුනක්** ලියන්න.

(4) එකිනෙකාට ගරු කරමින් සහයෝගයෙන් හා සමගියෙන් ජීවත් වීමට නිවසේ දී පාසලේ දී හා සමාජයේ දී කළ හැකි කාර්යයන් **තුන** බැගින් ලියා දක්වන්න.



***ජීවිතයට බිඳක්***

★ *එකිනෙකාට ගරු කරමු.*

★ *සියල්ලන් අගය කරමු.*

★ *සියල්ලන්ට එක සමානව සලකමු.*

★ *අන් මතවලට ඇහුම්කන් දෙමු.*

★ *සහයෝගයෙන් වැඩ කරමු.*